**යාපනය දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 15 - 2023**

---

**1. විගණන මතය**

**1.1** යාපනය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** යාපනය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15ට අදාළ 2023 වර්ෂයේ නිකුත් කර තිබුණ විගණන වාර්තා 15 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08ක් විසින් සමාලෝචිත වර්ෂයේ ගොවීන් වෙත ලබා දී නොතිබුණ සහනාධාර පොහොර තොග ටොන් 88.27ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොහොර සහනාධාර තොග මූල්‍ය ප්‍රකාශනවල තොගයක් ලෙස දැක්වීමට පියවර ගනු ලබන බව. | තොගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02ක සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමට දරා ඇති එකතුව රු.5,360,915ක් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කිරිමට පියවර ගනු ලබන බව. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03ක සමාලොචිත වර්ෂයේ භෞතික වශයෙන් නොපැවැති එකතුව රු.1,519,131ක් ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉවත් කිරිමට පියවර ගනු ලබන බව. | වත්කම්වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 04ක සමාලොචිත වර්ෂයේ භෞතික වශයෙන් නොපැවැති ජංගම නොවන වත්කම් රු.1,299,442ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 15ක සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු අක්කර බදු රු.1,071,189ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලැබිය යුතු අක්කර බදු නිවැරදි ලෙස හෙළිදරව් කිරිමට පියවර ගනු ලබන බව. | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පුලෝලි ගොවිජන සේවා කාරක සභාවේ පොහොර විකිණීමේ පාඩුව රු.251,019ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | පොහොර විකිණීමේ පාඩුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |
| (උ) | පුලෝලි ගොවිජන සේවා කාරක සභාවේ පසුගිය වර්ෂයේ සමුච්චිත අරමුදලේ අවසාන ශේෂය රු.3,905,028ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.6,238,013ක් වශයෙන් ඉදිරියට ගෙන ඒමෙන් රු.2,732,984ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | නිිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | සමුච්චිත අරමුදලේ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |

1.3.2 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්**

| | **විගණන නිරීක්ෂණය** | | | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| | **විෂයය** | **වටිනාකම රු.** | **ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි** | | |
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09ක සමාලෝචිත වර්ෂයේ ඉන්ධන වියදම්, රියදුරු කොමිස් මුදල් සහ අළුත්වැඩියා වියදම් | 2,837,546 | දෛනික ධාවන සටහන්, වාහන ලොග් පොත්, ඉන්ධන පරිභෝජන ලේඛනය, වාහන අළුත්වැඩියා ලේඛනය | එම ලේඛන නිසි පරිදි පවත්වා විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව. | යාවත්කාලීන කර පවත්වා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 14ක සමාලෝචිත වර්ෂය සඳහා වූ අක්කර බදු ආදායම | 1,048,545 | කුඹුරු ඉඩම් ලේඛන | කුඹුරු ඉඩම් ලේඛනය යාවත්කාලීන කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | කුඹුරු ඉඩම් ලේඛනය නිසි පරිදි පවත්වා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 13ක ලැබිය යුතු මුදල් ශේෂ 53ක් | 7,547,460 | විස්තරාත්මක ලැයිස්තු හා සනාථ කිරිමේ ලිපි | ලැබීම් පිළිබඳ ලිඛිතව සනාථ කිරීමේ ලිපි ලබාගැනීමට පියවර ගෙන ඇති බව. | විස්තරාත්මක ලැයිස්තු හා සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 15ක ගෙවිය යුතු මුදල් ශේෂ 55ක් | 30,670,325 | විස්තරාත්මක ලැයිස්තු හා සනාථ කිරිමේ ලිපි | ගෙවිය යුතු මුදල් පිළිබඳ ලිඛිත සනාථ කිරීම් ලබාගැනීමට පියවර ගෙන ඇති බව. | - එම - |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 03ක ස්ථාවර තැන්පතු ශේෂ 04ක් | 6,267,610 | බැංකු මඟින් ලබාගත් ශේෂ සනාථ කිරිමේ ලිපි | බැංකු සනාථ කිරිමේ ලිපි ලබාගැනීමට පියවර ගෙන ඇති බව. | බැංකු ශේෂ සනාථ කිරිමේ ලිපි ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | පුලෝලි ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර වත්කම් | 635,616 | ස්ථාවර වත්කම් ලේඛනය | නිැවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වාගත යුතුය. |

**1.3.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උඩුවිල් ගොවිජන සේවා කාරක සභාවේ ගෙවිය යුතු මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,158,926 ක් වුවද, උපලේඛන ප්‍රකාරව වටිනාකම රු.532,624 ක් වූයෙන් රු.626,302 ක නොසැසඳීමක් විය. | ඉදිරියේදී මෙම දෝෂ සිදුනොවී ගෙවිය යුතු නිවැරදි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වනු ලබන බව. | සැසඳීම් සිදු කර ගෙවිය යුතු නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශයේ දැක්විය යුතුය. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2020 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| | (i) 53 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 14ක් විසින් කෘෂිකාර්මික ඉඩම්වල ලේඛන සකස් කර නොතිබුණි. | කෘෂිකාර්මික ඉඩම් ලේඛනගත කිරීමේ කාර්යය අවසන් වීමෙන් පසුව මෙම ලේඛනය පවත්වාගෙන යනු කරනු ලබන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 55 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 13ක පරිපාලන ප්‍රදේශයේ පිහිටි කෘෂිකාර්මික ඉඩම් මැනීම් කිරිමට පියවර ගෙන නොතිබුණි. | වර්තමානයේ google map සහායෙන් මැනීම් සිදුකර කුඹුරු ඉඩම්වල ප්‍රමාණයන් ලැබී ඇති බව. | - එම - |
| | (iii) 56(i) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 06ක් විසින් අක්කර බදු ලේඛනයක් පවත්වා නොතිබුණි. | අක්කර බදු ලේඛනය ඉදිරියේදී විධිමත්ව පවත්වා ගෙන යනු ලබන බව. | - එම - |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) මුදල් රෙගුලාසි 110 (1) හා (2) | ගොවිජන සේවා කාරක සභා 10ක් විසින් හානි හා පාඩු පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණි. | හානි හා පාඩු පිළිබඳ ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 880 හා 881 | ගොවිජන සේවා කාරක සභා 08ක නිලධාරින් 20ක් විසින් ඇප මුදල් රු.95,000 තැන්පත් කර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභා 08ම ඇප මුදල් ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | - එම - |
| | (iii) මුදල් රෙගුලාසි 1646 | ගොවිජන සේවා කාරක සභා 14ක් විසින් ට්‍රැක්ටර් 109ක දෛනික ධාවන සටහන්වල මුල් පිටපත සහ එහි මාසික සාරාංශ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෛනික ධාවන සටහන්වල මුල් පිටපත සහ එහි මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කිරිමට පියවර ගෙන ඇති බව. | - එම - |
| (ඇ) | 2022 ජුනි 01 දිනැති අංක 7/5/12/11 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ලිපිය | ගොවිජන සේවා කාරක සභා 14 ක් විසින් දිස්ත්‍රික්කය භාර සහකාර කොමසාරිස් සහ ගොවිජන සේවා පරිපාලන කමිටු අතර ගනුදෙනුවලින් ලැබිය යුතු සහ ගෙවිය යුතු හිඟ මුදල් 2022 ජූලි 28 සහ වෙනත් ආයතන සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන අතර ගනුදෙනු 2022 අගෝස්තු 25 දිනට ප්‍රථම ද නිරවුල් කළ යුතු බව සඳහන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.26,138,191 නිරවුල් කර නොතිබුණි. | හිඟහිටි නිරවුල් කිරිමට පියවර ගෙන ඇති බව. | ලිපියේ විධිවිධාන ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 14කට අයත් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 15ක මෙහෙයුම් ප්‍රතිඵලවලින් රු.21,988,046 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,404,329ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලවල රු.416,283ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උරුම්පිරායි ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු. 191,564ක පාඩුව පොත්වලින් කපාහැරීමට වර්ෂ 28ක සිට පියවර ගෙන නොතිබුණි. | 1995 වර්ෂයේ සිදුවූ පාඩුව මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි කපාහැර ගැලපීම් කිරිමට කටයුතු කරන බව. | පාඩුව විධිමත් පරිදි පොත්වලින් කපාහැරීමට හේ නිරවුල් කිරීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 13ක වත්කම් අයිතම 1510ක් ඉවත් කිරිමට හෝ අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ විකිණීමට හෝ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වත්කම් කපා හැරීමටත් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ විකිණීමට පියවර ගනු ලබන බව. | වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කිරීම හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට පියවර ගතයුතුය. |
| (ඇ) | වාවකච්චේරි ගොවිජන සේවා කාරක සභාවේ 2022 වර්ෂයේදී ගොවීන්ට විකිණීම සඳහා ලැබී තිබූ රු.7,008,503ක් වටිනා පොහොර කෘෂිකාර්මික කටයුතු සඳහා උපයෝජනය නොකර පොදු සංචිතයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගබඩාවේ පැවැතුණි. | කෘෂිකාර්මික කටයුතුවලට භාවිතා කිරිමට පියවර ගනු ලබන බව. | ඵලදායි අලවි කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගතයුතුය. |
| (ඈ) | කීරිමලේ ගොවිජන සේවා කාරක සභාවේ 1985 දෙසැම්බර් 14 දින සොරකම් කළ රු.113,576ක් වටිනා ට්‍රැක්ටරයට අදාළ විධිමත් පරිදි කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට ක්‍රියාමාර්ග නොගෙන පසුගිය වර්ෂ 38ක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් ලෙස දක්වා තිබුණි. | ගැලපීමට පියවර ගනු ලබන බව. | විධිමත් අනුමැතිය යටතේ පාඩුව පොත්වලින් කපා හැරීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගෙන ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ඉ) | නල්ලූර් ගොවිජන සේවා කාරක සභාවේ ගිණුම් වාර්තාවල දක්වා තිබූ ගබඩා තොග පාඩුව රු.464,881ක් පිළිබඳව වර්ෂ 28ක සිට නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදී නිවැරදි කිරිමට පියවර ගෙන ඇති බව. | පාඩු අය කිරීමට හෝ විධිමත් පරිදි පාඩුව පොත්වලින් කපාහැරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගතයුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 04ක සමාලෝචිත වර්ෂයේ කල් ඉකුත් වූ රු.328,949 ක අයිතම 298ක් සුදුසු ක්‍රියාමාර්ග නොගෙන ගබඩාවේ රඳවා තිබුණි. | කල් ඉකුත් වූ අයිතම ඉවත් කිරිමට ඉදිරියේදී පියවර ගනු ලබන බව. | ඉදිරියේදී මෙවැනි පාඩු සිදු නොවීමට ක්‍රමවේද සැකසීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නල්ලූර් ගොවිජන සේවා කාරක සභාවේ ගොවි සංවිධානවල ගොවීන්ගේ සිසු දරුවන්ට පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ දරුවන්ට ත්‍යාග පිරිනැමීම සඳහා ස්ථාවර තැන්පතු පොලී මුදලින් රැස්කළ රු.2,357,366 ක් වර්ෂ 05ක සිට සිසුන්ට ලබානොදී ස්ථාවර තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි. | මෙම වර්ෂයේ කටයුතු කරනු ලබන බව. | අරමුදල් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | කයිතඩි ගොවිජන සේවා කාරක සභාව විසින් ලීටර 2579.5ක ECO vita පොහොර උචිත අරමුණු සඳහා උපයෝජනය නොකර ගබඩාවේ රඳවා තබා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | පොහොර අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.3 නිෂ්කාර්ය දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12ක පැවැති ට්‍රැක්ටර් 57ක් සහ ට්‍රේලර් 06ක් වර්ෂ 02 සිට 13ක් දක්වා කිසිදු නඩත්තුවකින් තොරව අක්‍රිය තත්ත්වයෙන් පැවැති අතර ඒවා අළුත්වැඩියා කර භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම ට්‍රැක්ටර් සහ ට්‍රේලර් අළුත්වැඩියා කර පරිහරණය කිරීමටත්, ඉතිරි ඒවා ඉවත් කිරීමටත් කටයුතු කරනු ලබන බව. | ට්‍රැක්ටර් සහ ට්‍රේලර් උපයෝජනය සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04ක් සඳහා 2019 වර්ෂයේදී රු.864,154ක් වටිනා පස් පරීක්ෂා කිරීමේ මෙවලම් 04ක් ලබාදී රු.32,000ක් වැය කර පුහුණු පන්ති පවත්වා තිබූ නමුත් එම මෙවලම් භාවිතයට ගෙන නොතිබුණි. | මෙම මෙවලම් භාවිතා කර පසෙහි PH, EC ආදිය පමණක් දැනගත හැකිය. එසේ වුවත්, පසෙහි පොහොර ප්‍රමාණය මැනීමට නොහැකි වන අතර මෙම මෙවලම් සඳහා රසායන ද්‍රව්‍ය ලබාගැනීමට නොහැකි නිසාත් මේ දක්වා මෙම මෙවලම් භාවිතා කර නොතිබුණු බව. | පස් පරීක්ෂා කිරීමේ මෙවලම් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.4 වෙනත් පාර්ශවයන්ට අයත් සම්පත් උපයෝජනය කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ ලබාදුන් ට්‍රැක්ටර් 96ක් පසුගිය වර්ෂ 12ක සිට හිමිකාරිත්වය පවරා ගැනීමෙන් තොරව ගොවිජන සේවා කාරක සභා 13ක් විසින් භාවිතා කරමින් පැවතුණි. | ට්‍රැක්ටර් අපගේ දෙපාර්තමේන්තුවේ නමට හිමිකාරිත්වය මාරුකිරීමට පියවර ගෙන ඇති බව. | ට්‍රැක්ටර්වල හිමිකාරිත්වය පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 10ක් විසින් රජයේ ඉඩම්වල රු.56,871,773ක් වටිනා ගොඩනැගිලි ඉදිකර භාවිතා කරමින් පැවැති නමුත් එම රජයේ ඉඩම් පවරා ගැනිමට පසුගිය වර්ෂ 32ක සිට පියවර ගෙන නොතිබුණි. | එම රජයේ ඉඩම් කාරක සභාවන් විසින් ඒවාට පවරා ගැනිමේ මූලික අදියරේ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ඉඩම් පවරා ගැනිමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට තනතුරු 06 අනුමත කාර්ය මණ්ඩලය 348ක් පැවැති නමුත් තථ්‍ය කාර්ය මණ්ඩලය 162ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩු 201ක් පිරවීමට හෝ අතිරික්ත කාර්ය මණ්ඩලය 15ක් සම්බන්ධයෙන් ගොවිජන සේවා කාරක සභා 15ක් විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමටත් ගොවිජන සේවා බලප්‍රදේශයට අයත් අතිරික්ත කාර්ය මණ්ඩලය සේවා මධ්‍යස්ථාන වෙත අවශ්‍යතා පදනම මත ස්ථාන මාරුකිරිමටත් කටයුතු කරමින් පවතින බව. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත කාර්ය මණ්ඩලය වෙනත් කාර්යාල වෙත ස්ථාන මාරුකිරිමටත් ක්‍රියාමාර්ග ගතයුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා 15ක් විසින් වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළයුතු දෑ සහ එහි ප්‍රගතිය මැනීමේ දර්ශක වර්ෂ 05ක සිට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරි කාලයේදී ගැනීමට පියවර ගනු ලබන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5. ගොවිජන බැංකු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන කාරක සභා 14ක් විසින් 2009 සිට 2023 දක්වා කාලපරිච්ඡේදයේ ගොවීන්ට ලබාදුන් ණය මුදලින් ගොවීන් 248කගෙන් ලැබිය යුතු හිඟණය රු. 17,083,182ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට පියවර ගනිමින් පවතින බව. | හිඟමුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය. |

**6. පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 14ක තොග සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරි කාලයේදී තොග සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් විධිමත් පරිදි පවත්වාගෙන යනු ලබන බව. | තොග සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් විධිමත් පරිදි පවත්වාගෙන යායුතුය. |